**ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මුද්දර කාර්යාංශය සමග ඒකාබද්ධව පවත්වනු ලබන දීප ව්‍යාප්ත නත්තල් තැපැල් මුද්දර චිත්‍ර තරගය 2026**

**නිර්මාණ (චිත්‍ර) ඉදිරිපත් කළ යුතු මාතෘකාව** (සියලු වයස් කාණ්ඩ සඳහා)

"වැඩමකළ හ ගැළවුම්කරුවන්; ගී ගයති දෙව්දූතුන්; නමදිති සියල්ලෝ ම එතුමන්"

**වයස් කාණ්ඩ**

- වයස අවුරුදු 10ට අඩු (2016.11.01 දිනෙන් පසු උපන් )
- වයස අවුරුදු 10 සිට 15 දක්වා (2011.11.01 සිට 2016.10.31 දක්වා උපන්)
- වයස අවුරුදු 15 සිට 21 දක්වා (2005.11.01 සිට 2011.10.31 දක්වා උපන්)
- වයස අවුරුදු 21ට වැඩි (2005.11.01 දිනට පෙර උපන්)

**තරග කොන්දේසි**

- දේශීයව හෝ විදේශීයව වාසය කරන ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුට තරගය සඳහා ඉදිරිපත් විය හැක.
- සිතුවම් A4 ප්‍රමාණයේ කඩදාසියක (දිග අඟල් 11.7 හා පළල අඟල් 8.3) තරස් අතට සිතුවම් කර (A4 - Landscape) එවිය යුතුයි.




- නිර්මාණයේ වටේට ½ ඉඩ ප්‍රමාණයක් (අඟල් ½ රාමුවක්) තිබිය යුතුය.
- පාට පැන්සල් හැර ඕනෑම මාධ්‍යයක් භාවිතා කළ හැක
- මෙම චිත්‍ර තරගයක් නොවන අතර අදාල සිතුවම මුද්දරයක් සඳහා යොදා ගන්නා බැවින් එය මුද්දරයකට ගැලපෙන ලෙස නිර්මාණය විය යුතුය. චිත්‍රයේ රේඛා පැහැදිලි විය යුතුය.
- සිතුවමෙහි නත්තලේ මූලික සංකේතයන් පිළිබිඹු විය යුතුය. (උදා - වල්ගා තරුව, ගවලෙන)
- සිතුවම මතුපිට අකුරු නොලිවිය යුතුය.
- සිතුවම් යොමු කිරීමේ දී මේ සමග ඇති අයදුම්පත සම්පූර්ණ කර චිත්‍රයේ පිටුපස අලවා යොමු කළ යුතුයි.
- අදාල නිර්මාණ තමා විසින්ම කළ නිර්මාණයක් බවට ආගමික පූජකතුමකු / පාසලේ විදුහල්පති / දහම්පාසල් ප්‍රධානාචාර්ය / සාමවිනිසුරුවරයකු / රජයේ විධායක නිලධාරියකු විසින් සනාථ කළ යුතුය.
- නිර්මාණ බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ 'නත්තල් තැපැල් මුද්දරය චිත්‍ර තරගය - 2026' ලෙස සඳහන් කර, අධ්‍යක්ෂ, ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව, නො. 180, තුන්වල මහළ, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ රජයේ වැඩ කරන දිනවල පෙ.ව. 8.30 හා ප.ව. 4.15 අතර කාර්යාලයට ගෙනැවිත් භාරදිය හැක.

**ජයග්‍රාහී නිර්මාණයන් තෝරාගන්නා ආකාරය**

- සෑම වයස් කාණ්ඩයක් යටතේම 1,2,3 ස්ථාන සඳහා ජයග්‍රාහකයින් තෝරා ගනු ලැබේ.
- එම ජයග්‍රාහී සිතුවම් අතරින් එක් සිතුවමක් තැපැල් මුද්දරය සඳහා තෝරා ගැනේ.
- වයස් කාණ්ඩ යටතේ කුසලතා දක්වා ඇති චිත්‍ර සඳහා ද සහතික පත් ලබා දෙනු ලැබේ.

**නිර්මාණ තෝරා ගැනීම**

- තැපැල් මුද්දර සඳහා මුද්දර කාර්යාංශයේ නිලධාරීන් ඇතුළු විද්වත් විනිශ්චය මණ්ඩලයක් මගින් සිදු කෙරේ.
- තරඟ කොන්දේසි සමඟ එකඟ නොවන සියලුම නිර්මාණයන් ප්‍රතික්ෂේප වන අතර නිර්මාණයන්ගේ අවසාන තීරණය විනිශ්චය මණ්ඩලය විසින් ගනු ලැබේ.
- තෝරා ගන්නා ලද ජයග්‍රාහී නිර්මාණයන් මුද්දර කාර්යාංශයේ අවශ්‍යතාවයන්ට හා මුද්දර ප්‍රමිතීන්ට අනුව අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට එකඟ විය යුතුය.

**චිත්‍ර යොමුකළ යුතු අවසන් දිනය - 2026-11-05**

**වැඩි විස්තර සඳහා 0112665584 දුරකථන අංකයෙන් විමසන්න**

අධ්‍යක්ෂ,
ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව